# <u>මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ " සංශෝධන අංක 02 "</u>

2012.11.09 දිනැතිව සංශෝධිත සහ 2012.10.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ ඡේද අංක 17 හි සඳහන් අන්තර්කාලීන විධිවිධාන යටතට ව්‍යවස්ථා සංශෝධන අංක 02 යටතේ උපඡේද අංක **17.1.1** පහත සඳහන් පරිදි ඇතුළත් කරනු ලැබේ.

| නව උප ඡේද අංකය | දැනට තිබෙන පෙළ | යෝජිත සංශෝධනය | හේතු |
|---|---|---|---|
| **17.1.1** | දැනට ඇතුළත් කර නැත. | 2012.10.17 සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීමෙන් පසුව,<br>i. 2012.10.17 දිනට පෙර 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණයෙන් සමත් නිලධාරින් නව සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව යටතේ සඳහන් 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් වීමෙන් නිදහස් කරනු ලැබේ.<br>ii. 2012.10.17 දිනට පෙර 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණයෙන් හෝ එක් විෂයයක් හෝ අසමත් නිලධාරින් නව සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව යටතේ 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණයෙන් සමත් විය යුතුවේ.<br>iii. 2012.10.17 දිනට පෙර 2 වැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණයෙන් සමත් නිලධාරින් නව සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව යටතේ සඳහන් 2 වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් වීමෙන් නිදහස් කරනු ලැබේ.<br>iv. 2012.10.17 දිනට පෙර 2 වැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණයෙන් හෝ එක් විෂයයක් හෝ අසමත් වීම මත වැටුප් වර්ධක විලම්භනය වන නිලධාරින්ගේ වැටුප් වර්ධක විලම්භනය කිරීම අත්හිටවනු ලබන අතර, නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක **2012.10.17** දින සිට එම නිලධාරින්ට ඉදිරියට වැටුප් වර්ධක උපයාගැනීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. එසේ වුවද 2 වැනි කාර්යක්ෂමතා කඩඉම අසමත් නිලධාරින් II ශ්‍රේණියට උසස් වීමෙන් පසුව නව සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව යටතේ 2 වැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණයෙන් සමත් විය යුතුවේ. | 2012.10.17 දිනට පෙර අනුමතව පැවති සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ අදාළ පරිපාටීන් යටතේ කාර්යක්ෂමතා කඩඉම් දෙකක් පැවතීම නිසා නව සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමේදී බලපවත්වන ආකාරය පැහැදිලි කිරීම සහ ගැලපීම සඳහා සිදුකරන ලදී. |

මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ ඉහත යෝජිත සංශෝධනය 2016.07.26 දින රැස්වූ ගරු කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

| නම | | අත්සන |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | ................................ |
| 02. යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | ................................ |
| 03. පී.පී.එස්.ඒ. දිසානායක මිය | (සාමාජික) | ................................ |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ................................ |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | ................................ |

**මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :**

අනුමත කරමි / නොකරමි

................................

නිලූකා ඒකනායක

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර

2016.09.02